**<u>සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තුමේන්තුව - සති පාසල</u>**

**01. ශ්‍රේණිය : 11** **විෂයය: ගෘහ ආර්ථික විද්‍යාව** **සතිය : 14 වන සතිය**

**02. පාඩම හෝ ඒකකය: 13 ළදරුවන් රැක බලා ගැනීම**

**03. මෙම පාඩම තුලින් ලබා ගත හැකි ඉගෙනුම් ඵල:**

- නවජ දරුවා හඳුන්වයි.
- නවජ දරුවෙකුගේ ගතිලක්ෂණ විස්තර කරයි.
- පළමු වසර තුල ළදරුවාගේ සංවර්ධනයට අදාළ සුවිශේෂී ලක්ෂණ විමර්ශනය කරයි.

04. ශිෂ්‍යයා කල යුතු කාර්යයන්:

I. ගෘහ ආර්ථික විද්‍යාව පෙළ පොතේ දහතුන් වන පාඩම හොඳින් කියවා තේරුම් ගන්න.
II. පළමු වසර තුලදී ළදරුවෙකුගේ වර්ධනයේ ස්වභාවයන් සහ ඒ එක් එක් වර්ධන ආකාරයේදී දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ හා ඔවුන් පිළිඹිබු කරන හැකියා පිලිබඳ හොඳින් අධ්‍යයනය කර අවබෝධයක් ලබා ගන්න.
III. ඔබ අධ්‍යයනය කල ඉහත ලක්ෂණ ළදරුවන් කිහිප දෙනෙකු තුල දෘශ්‍යමාන වන ආකාරය සොයා බලන්න. ඔබගේ නිවසේ , ඔබගේ වැඩිමහල් සහෝදරයෙකුගේ හෝ ඥාතියෙකුගේ ළදරුවෙකු සිටිනම් මෙම ලක්ෂණ සහ හැකියාවන් වසර තුලදී ඔබට අත්දැකීමෙන්ම හඳුනා ගත හැකිය. එකම වයසේ ළදරුවන් දෙදෙනෙකු තුල වුවද යම් යම් අවස්ථා වලදී ඉහත වර්ධනයන් හා සම්බන්ධ ලක්ෂණ තරමක් ප්‍රමාද වීමට හෝ ඉක්මන් වීමට හැකි බව අවබෝධ කර ගන්න.

05. ඉහත ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය තොරතුරු තව දුරටත් අධ්‍යයනය කිරීම සඳහා අන්තර්ජාලය හා සම්බන්ධ වන්න.

- https://www.youtube.com/watch?v=GuITA87wtLg

වෙනත් ඉගෙනුම් ආධාරක: තරුණී, රජින, සිරිකත, වැනි පුවත්පත් හා සගරා

06. ඇගයීම / තක්සේරුකරණ ක්‍රමවේදය:

I. නවජ දරුවා යන්න හඳුන්වන්න. ලකුණු 05
II. නවජ දරුවාගේ සුවිශේෂී ගති ලක්ෂණ මොනවාද? ලකුණු 05
III. නවජ දරුවාගේ සංවේදන නම් කර ඒ සඳහා ප්‍රතිචාර දක්වන අයුරු වගුවක් මගින් ඉදිරිපත් කරන්න. ලකුණු 10
IV. ශ්‍රී ලාංකික නිරෝගී දරුවෙකුගේ උපත් බර , උස, හිස වට ප්‍රමාණ සඳහන් කරන්න. ලකුණු 05